# NALANDA COLLEGE – COLOMBO 10

NALANDA VIDYALAYA COLOMBO 10

Unit Test

| 10 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය 13 |
|---|---|---|

## ජෛව ගෝලය

01. අචලතාපී පෘෂ්ඨවංශී කාණ්ඩ දෙකක් වන්නේ,
    1) ආවේස්, රෙප්ටීලියා  2) මැමේලියා, ඇම්ෆිබියා
    3) ආවේස්, මැමේලියා  4) රෙප්ටීලියා, පිස්කේස්

02. පැපොල් ශාකයේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
    A - ජාලාභ නාරටි වින්‍යාසයක් තිබීම
    B - පංචාංග පුෂ්ප සැකැස්මක් තිබීම
    C - අතු නොබෙදුනු කඳක් තිබීම
    D - අකෘෂ්ඨීය ශාක කඳක් තිබීම

    ඉහත ලක්ෂණ අතරින් පැපොල් ද්විබීජපත්‍රී ශාක ලෙස සැලකීමට හේතු වූ ලක්ෂණ මොනවාද2
    1) A හා B පමණි  2) C හා D පමණි
    3) A, B හා C පමණි  4) ඉහත සියල්ලම

13. පහත දැක්වෙන ශාක අතරින් විවෘත බීජක ශාකයක් වන්නේ
    1) පයිනස්  2) පොල්  3) තණකොළ  4) වී

04. අරීය සමමිතියක් සහිත අපෘෂ්ඨවංශී කාණ්ඩ වන්නේ
    1) සිලන්ටරේටා, ඇනෙලිඩා  2) සිලන්ටරේටා, මොලුස්කා
    3) මොලුස්කා, ඇනෙලිඩා  4) සීලන්ටරේටා, එකයිනොඩර්මේටා

05. පහත පෘෂ්ඨවංශී කාණ්ඩ අතරින් ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමට ජලය අවශ්‍ය කණ්ඩය වන්නේ,
    1) පිස්කේස්  2) ඇම්ෆිබියා  3) රෙප්ටීලියා  4) ආවේස්

06. කයිටින් වලින් සැදුනු බාහිර සැකිල්ලක් සහිත සත්ත්ව කාණ්ඩය වන්නේ
    1) ආත්‍රපෝඩා  2) ඇනෙලිඩා  3) මොලුස්කා  4) ෆන්ගයි

07. තණකොළ ශාකයේ ලක්ෂණයක් වන්නේ,
    1) කඳ අතු බෙදී තිබීම  2) ජාලාකාර නාරටි වින්‍යාසයක් තිබීම
    3) අපුෂ්ප ශාකයක් වීම  4) ත්‍රි අංක පුෂ්ප සැකැස්ම තිබීම

08. වලිකුකුළාගේ විද්‍යාත්මක නාමය නිවැරදිව දක්වා ඇත්තේ,
    1) Gallus lafayetti  2) *Gallus* *lafayetti*
    3) Gallus Lafayetti  4) *Gallus lafayetti*

09. ජීවීන් සතු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
    A - සඛණ්ඩ දේහය  B - තෙත සම  C - තෙත පරිසරවල ජීවත්වීම

    ඉහත ලක්ෂන සහිත ජීවී කාණ්ඩය වන්නේ
    1) ඇනෙලිඩා වංශය  2) ආත්‍රොපෝඩා වංශය
    3) සිලන්ටරේටා වංශය  4) මොලුස්කා වංශය

10. කැල්සියම් කාබනේට් වලින් සැදුනු බාහිර සැකිල්ලක් සහිත ජීවී කාණ්ඩය වන්නේ
    1) සිලන්ටරේටා  2) ඇනෙලිඩා  3) මොලුස්කා  4) ආත්‍රොපෝඩා

11. බීජ සාදන අපුෂ්ප ශාකය වන්නේ
    1) සෙලජිනෙල්ලා  2) පෝගනාටුම්  3) මඩු  4) අඹ

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

12. ඇනෙලිඩා කාණ්ඩයේ තිබිය හැකි ලක්ෂණයක් වන්නේ
    1) ද්විප්‍රස්තර  2) ජලජ පරිසරයක ජීවත්වීම
    3) ඛණ්ඩනය වූ දේහ  4) අරීය සමමිතික බව

13. බූවල්ලා සහ පත්තෑයා අයත්වන ජීවී කාණ්ඩ පිළිවෙලින් දැක්වෙන්නේ,
    1) මොලුස්කා, ඇනෙලිඩා  2) නිඩාරියා, ආත්‍රපෝඩා
    3) මොලුස්කා, ආත්‍රපෝඩා  4) නිඩාරියා, ඇනෙලිඩා

14. පහත ලක්ෂණ අතරින් පෙන්ගුයින් සතු ලක්ෂණයක් නොවන්නේ,
    1) සැහැල්ලු අස්ථි සැකිල්ලක් තිබීම
    2) රෝමවලින් ආවරණය වූ සමක් තිබීම
    3) අචලතාපී වීම
    4) කුටීර හතරකින් යුතු හෘදයක් තිබීම

15. පහත දැක්වෙන කුමන වරණය මගින් ඇල්ගී වල ප්‍රයෝජනයක් සඳහන් නොවේද?
    1) බැක්ටීරියාවල වගා මාධ්‍ය පිළියෙල කිරීමට අවශ්‍ය ඒගාර් නිස්සාරණය කිරීම සඳහා
    2) ප්‍රතිජීවක ඖෂධ නිදපවීම සඳහා
    3) අයිස්ක්‍රීම් නිෂ්පාදනයට අවශ්‍ය ඇල්ජිනික් අම්ලය නිස්සාරණය කිරීම
    4) ජලජ පරිසරවල ඇති ආහාර දමවල ප්‍රාථමික නිෂ්පාදකයන් වේ

## ව්‍යුහගත රචනා

01. 10 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායම සිදුකළ ක්ෂේත්‍ර චාරිකාවකදී එක්රැස් කරගත් තොරතුරු පහත වගුවේ දැක්වේ.

| කණ්ඩායම | සතුන් පිළිබඳ රැස්කරගත් තොරතුරු | නිරීක්ෂණය කළ සතුන් ගණන |
|---|---|---|
| A | ගාත්‍රා හතරක් ඇත. බාහිර කන්පෙති සහ රෝමවලින් ආවරණය වූ සමක් ඇත. | 1 |
| B | පණු ආකාර දේහයකි. දේහයේ දෙකෙළවර චූෂක ඇත. | 22 |
| C | ගාත්‍රා 6කි. දිලිසෙන පටලමය පිහාටු ඇත. සන්ධිමය පාද ඇත. | 5 |
| D | අනාකූල දේහ හැඩයක් ඇත. තිල් පැහැ පිහාටු සහිත දේහයකි. දිගු හොටක් ඇත. | 1 |
| E | රෝස පැහැති ඛණ්ඩනය වූ දේහ ඇත. පත්‍ර ආකාර දේහ ඇත. පස් තුල ගුල් හාරයි. | 2 |
| F | ගාත්‍රා හතරකි. දිගු දිවක් ඇත. ජලය තුලද ජීවත්විය හැකිය. | 2 |
| G | ත්‍රිකෝණාකාර හිස, වියළි කොරල සහිත සම, දිගු දේහය | 1 |
| H | බාහිර කවච ඇත. පේශිමය පාදයක් දැකිය හැකිය. ගසක සිටිනු දක්නට ලැබුණි. | 6 |

A i) මෙම ක්ෂේත්‍ර චාරිකාවේ දී හමු වූ සතුන් ගණන කොපමණද ?

.....................................................................................................

ii) සිසුන් විසින් අධ්‍යයනය කළ පරිසර පද්ධතිය කෙබඳු වේද?

.....................................................................................................

iii) a) පරිසර පද්ධතිය තුළ විවිධ ජීවීන් ජීවත් වෙයි. ඉහත පරිසර පද්ධතියේ දෙවනුව සුලබම ජීවීන් කාණ්ඩය පවතින ප්‍රතිශතය මුළු සංඛ්‍යාව අනුව කොපමණ ද?

.....................................................................................................

b) ඉහත iii) a හි සඳහන් කල ජීවීන් සතු තවත් බාහිර ලක්ෂණයක් ලියන්න.

.....................................................................................................

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

iv) පහත ජීවී කණ්ඩාවලට අදාල ජීවී කාණ්ඩයට අදාල අක්ෂරය සඳහන් කරන්න.
   a) මොලුස්කා ……………………..
   b) ඇම්ෆිබියා ……………………..
   c) ආත්‍රපෝඩා ……………………..
   d) රෙප්ටීලියා ……………………..

v) ඉහත වගුවේ ඇති ජීවීන් අතර සඳහන් නොවන අපෘෂ්ඨවංශී ජීවී කාණ්ඩයක් නම් කරන්න.
……………………………………………………………………………………………

vi) ඉහත ජීවීන් අතරින් හෘදයේ කුටීර තුනක් සහිත ජීවී කණ්ඩායමේ අක්ෂරය කුමක් ද?
……………………………………………………………………………………………

## රචනා

02. ජීවීන් වර්ගීකරණයේ විවිධ ප්‍රයෝජන ඇත. ජීවීන් වර්ග කරන එක් ක්‍රමයක් වන්නේ ස්වභාවික වර්ගීකරණයයි.

i) ජීවීන් වර්ග කරන අනෙක් ක්‍රමය කුමක් ද?

ii) ස්වභාවික වර්ගීකරණය මගින් ජීවීන් වර්ග කිරීමෙන් ඇති වාසි 2ක් සඳහන් කරන්න.

iii) අධිරාජධානි දෙකක් වන ආකියා සහ බැක්ටීරියා අතර සමානකමක් සහ වෙනස්කමක් සඳහන් කරන්න.

iv) ඉයුකැරියා අධිරාජධානියෙන්, බැක්ටීරියා අධිරාජධානිය වෙන්කරගත හැකි ලක්ෂණයක් ලියන්න.

v) ඇනිමාලියා, ප්ලාන්ටේ සහ ෆන්ගයි රාජධානි, ඉයුකැරියා අධිරාජධානිය යටතට ගැනේ.
   a) ඉයුකැරියා අධිරාජධානියට අයත් අනෙක් රාජධානිය කුමක් ද?
   b) ප්ලාන්ටේ රාජධානියේ ප්‍රයෝජන 2ක් ලියන්න.
   c) ෆන්ගයි රාජධානියේ ජීවීන් සතු විශේෂ ලක්ෂණ 2ක් ලියන්න.
   d) සලමන්දරා සහ හූනා යනු පෘෂ්ඨවංශී කාණ්ඩයට අයත් ජීවීන් දෙදෙනෙකි.
      ඉහත ජීවී කාණ්ඩ අතර ඇති
      i) සමානතාවයක්
      ii) වෙනස්කමක් ලියන්න.

B. විද්‍යාත්මක ක්‍රමයකට ජීවීන් නාමකරණය ජීවීන් හඳුනා ගැනීමට වැදගත් වේ.

i) ද්විපද නාමකරනය මගින් ජීවීන් වර්ග කරමේ ක්‍රමය හඳුන්වාදුන් විද්‍යාඥයා කවරෙක් ද?

ii) ඉහත නාමකරණයට අයත්වන පද දෙක හඳුන්වන්න.

iii) ද්විපද නාමකරණයේ දී යොදා ගන්නා සම්මතයක් 2ක් ලියන්න.

iv) නාමකරණ ක්‍රියාවලිය නියාමනය කරන අන්තර්ජාතික ආයතන 2ක් ඇත. ශාක නාමකරණය නියාමනය කරන ආයතනය කුමක් ද?

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk